
# A/L 2016 Model Paper

# Economics





**Mr. Ananda Rathnayake**

BA (Business Statistics) USJ, MA (Economics) Colombo
Senior Lecturer, Department of Business Economics
University of Sri Jayewardenepura, Nugegoda

# අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය 2016

# General Certificate of Education (Advance Level) Examination - 2016

## ආර්ථික විද්‍යාව II

## Economics II

ආකෘති ප්‍රශ්න පත්‍රය

**උපදෙස් :**

**- "අ" උපකොටසින් අවම වශයෙන් ප්‍රශ්න 02 ක් ද, "ආ" උපකොටසින් අවම වශයෙන් ප්‍රශ්න 02 ක් ද තෝරා ගෙන ප්‍රශ්න 05 කට පමණක් පිළිතුරු සපයන්න.**

**- කාලය පැය තුනයි.**

සකස් කරන ලද්දේ,

**ආනන්ද රත්නායක**

- ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, ව්‍යාපාර ආර්ථික විද්‍යා අධ්‍යයනාංශය, කළමනාකරණ අධ්‍යයන හා වාණිජ විද්‍යා පීඨය

සහාය:

- **තිළිනි නවරත්න** (ව්‍යාපාර ආර්ථික විද්‍යා අධ්‍යයනාංශය, කළමනාකරණ අධ්‍යයන හා වාණිජ විද්‍යා පීඨය)
- **දිලාන් රාජපක්ෂ** (ව්‍යාපාර ආර්ථික විද්‍යා අධ්‍යයනාංශය, කළමනාකරණ අධ්‍යයන හා වාණිජ විද්‍යා පීඨය)

# “අ” උපකොටස

01\. **i.** නීච භාණ්ඩ හා අවගුණ භාණ්ඩ අතර පවතින වෙනස පැහැදිලි කරන්න.

(ලකුණු 04)

**ii.** ආර්ථික කාර්යක්ෂමතාවය ලබා ගැනීමේදී සම්පූර්ණ විය යුතු විවිධ කොන්දේසි කෙටියෙන් පැහැදලි කරන්න. (ලකුණු 04)

**iii.** හිඟකම හා දරිද්‍රතාවය අතර පවතින වෙනස පැහැදිලි කරන්න.

(ලකුණු 03)

**iv.** “ආර්ථික වර්ධනය මගින් හිඟකම නැමැති ප්‍රශ්ණය විසඳා ගත හැකිය.” එකඟවේද? ඔබගේ පිළිතුර නිෂ්පාදන හැකියා මායිම් වක්‍රය ආස්‍රයෙන් පැහැදිලි කරන්න. (ලකුණු 05)

**v.** නූතනයේ ධනවාදී, සමාජවාදී, වෙළෙඳපොළ හා සැලසුම් ආදී ලෙස ආර්ථික පද්ධතීන් පැහැදිලිව වෙන්කල නොහැක. මෙම සියලු ආර්ථික පද්ධතීන්ගේ සංකලනයක් පවතී. පැහැදිලි කරන්න. (ලකුණු 04)

## i. නීච භාණ්ඩ හා අවගුණ භාණ්ඩ අතර පවතින වෙනස පැහැදිලි කරන්න. (ලකුණු 04)

- පරිභෝජනයේදී සෘණ උපයෝගීතාවයක් හෙවත් අනු උපයෝගීතාවයක් ලැබෙන, පරිභෝජනයෙන් බැහැර වීම සඳහා සමහරවිට මිලක් ගෙවීමට සිදුවන භාණ්ඩ නීච භාණ්ඩ වශයෙන් හඳුන්වයි.

උදාහරණ:- කැලිකසල, පරිසර දූෂණය (ලකුණු 01)

- පරිභෝජනයේදී සෘණ බාහිරතා ඇති කරන භාණ්ඩ අවගුණ භාණ්ඩ නම් වේ.

උදාහරණ:- මත්පැන්, දුම්වැටි, ගණිකා වෘත්තිය (ලකුණු 01)

- නීච භාණ්ඩ පරිභෝජනයේදී භාණ්ඩය පරිභෝජනය කරන පාර්ශවයට මෙන්ම බාහිර පාර්ශවයට පවා සෘණ උපයෝගීතාවයක් හටගත හැකිය. නමුත් අවගුණ භාණ්ඩ පරිභෝජනයේදී පරිභෝජනය කරන පාර්ශවයට උපයෝගීතාවයක් ලැබෙන නමුත් බාහිර පාර්ශවයට සෘණ උපයෝගීතාවයක් පවතී. එම නිසාම අවගුණ භාණ්ඩ වල සමාජ ප්‍රතිලාභ පෞද්ගලික ප්‍රතිලාභ වලට වඩා අඩු වේ. (ලකුණු 02)

**ii. ආර්ථික කාර්යක්‍ෂමතාවය ලබා ගැනීමේදී සම්පූර්ණ විය යුතු විවිධ කොන්දේසි කෙටියෙන් පැහැදලි කරන්න. (ලකුණු 04)**

- ආර්ථික කාර්යක්ෂමතාවය ලගා කර ගැනීම සඳහා ප්‍රධාන කොන්දේසි දෙකක් ඉටුවිය යුතුය.

  1. නිෂ්පාදන කාර්යක්ෂමතාවය (භාණ්ඩ හා සේවා අවම පිරිවැයට නිෂ්පාදනය කිරීම)
  2. බෙදා හැරීමේ කාර්යක්ෂමතාවය (සමාජය වඩාත් කැමති භාණ්ඩ සංයෝගය නිපදවීමට සම්පත් ප්‍රශස්ථ ලෙස බෙදා හැරීම) (ලකුණු 02)

- නිෂ්පාදන කාර්යක්ෂමතාවය ඉටුවීම සඳහා කොන්දේසි දෙකක් ඉටුවිය යුතුය.

  1. පූර්ණ සේවා නියුක්තිය (සියලු සම්පත් උපයෝජනය කිරීම)
  2. පූර්ණ නිෂ්පාදනය (සියලු සම්පත් උපරිම ද්‍රව්‍යාත්මක ඵලදාවක් ලැබෙන ලෙස කාර්යක්ෂමව උපයෝජනය කිරීම)

- බෙදා හැරීමේ කාර්යක්ෂමතාවය ලගාකර ගැනීම සඳහා පහත සඳහන් කොන්දේසිය ලගාකර ගත යුතුය.

  ආන්තික ප්‍රතිලාභය = ආන්තික පිරිවැය

  (ආන්තික ප්‍රතිලාභය = ගෙවීමට කැමති උපරිම මිල) (ලකුණු 02)

## iii. හිඟකම හා දරිද්‍රතාවය අතර පවතින වෙනස පැහැදිලි කරන්න.

(ලකුණු 03)

- හිගකම යනු අසීමිත මිනිස් වුවමනාවන් සපුරා ගැනීම සඳහා, සමාජයක පවතින සම්පත් සම්භාරය ප්‍රමාණවත් නොවීමයි. හිගකම ඇතිවීම සඳහා මිනිස් වුවමනාවන් අසීමිත වීම සහ සම්පත් සීමිත වීම යන හේතූන් බලපායි. (ලකුණු 01)

- දරිද්‍රතාවය යනු මිනිසුන්ගේ මූලික මිනිස් අවශ්‍යතාවයන් සහ වුවමනාවන් (ආහාර, ඇඳුම, නිවාස වැනි) සපුරා ගැනීම සඳහා ආදායම ප්‍රමාණවත් නොවීමයි.

(ලකුණු 01)

- දරිද්‍රතාවය නැමැති ප්‍රශ්නය හිගකම නිසා ඇතිවන අතුරු ප්‍රශ්නයක් වේ. දරිද්‍රතාවය නැමැති ප්‍රශ්නය විවිධ ප්‍රතිපත්ති සැලසුම් හා ව්‍යාපෘති තුලින් ඉවත් කළ හැකි අතර හිගකම තුරන් කළ නොහැකි සදාතනික ප්‍රශ්නයකි. හිගකම සඳහා සෑම සමාජයක්ම මුහුණ දෙන අතර දරිද්‍රතාවය සඳහා මුහුණදෙනු ලබන්නේ සමහර සමාජයන් පමණි.

(ලකුණු 01)

**iv. “ආර්ථික වර්ධනය මගින් හිඟකම නැමැති ප්‍රශ්ණය විසඳා ගත හැකිය.” එකඟවේද? ඔබගේ පිළිතුර නිෂ්පාදන හැකියා මායිම් වක්‍රය ආශ්‍රයෙන් පැහැදිලි කරන්න. (ලකුණු 05)**


- එකග විය නොහැක. හිගකම ආර්ථික වර්ධනය මගින් විසඳාගත නොහැකි සදාතනික ප්‍රශ්නයකි. (ලකුණු 01)

- හිගකම යනු අසීමිත මිනිස් වුවමනාවන් සපුරා ගැනීම සඳහා පවත්නා සම්පත් සම්භාරය ප්‍රමාණවත් නොවීමයි. ආර්ථික වර්ධනය යනු මූර්ත නිමවුමේ අඛණ්ඩ වර්ධනය වේ. (ලකුණු 01)

- ආර්ථික වර්ධනයත් සමග සපුරාගත හැකි මිනිස් වුවමනාවන් ප්‍රමාණය වැඩිවේ. නමුත් ආර්ථිකය වර්ධනය වන විට ආර්ථිකය වර්ධනය වන වේගයට වඩා වැඩියෙන් මිනිසුන්ගේ වුවමනාවන් වර්ධනය වේ. එම නිසා ආර්ථික වර්ධනය මගින් හිගකම තුරන් කල නොහැක. (ලකුණු 02)

පළමු ප්‍රස්තාරයට අනුව මිනිසුන්ගේ අපේක්ෂිත භාණ්ඩ සංයෝගය A ලක්ෂයේ පවතින නිසා හිගකම පවතී. දෙවන ප්‍රස්තාරයට අනුව ආර්ථිකය වර්ධනය වී නිෂ්පාදන හැකියා මායිම් වක්‍රය $PPC_1$ සිට $PPC_2$ දක්වා විතැන්වන විට මිනිසුන්ගේ අපේක්ෂිත භාණ්ඩ සංයෝගයද A සිට B දක්වා වරධනය වේ. එම නිසා හිගකම තවදුරටත් පවතී.

(ලකුණු 01)



v. නූතනයේ ධනවාදී, සමාජවාදී, වෙළෙඳපොළ හා සැලසුම් ආදී ලෙස ආර්ථික පද්ධතීන් පැහැදිලිව වෙන්කල නොහැක. මෙම සියලු ආර්ථික පද්ධතීන්ගේ සංකලනයක් පවතී. පැහැදිලි කරන්න. (ලකුණු 04)

- ධනවාදී ආර්ථිකයක් යනු දේපළ සහ සම්පත් පෞද්ගලික අංශය සතු ආර්ථිකයකි. වෙළඳපොල ආර්ථිකයක් යනු සම්පත් බෙදා හැරීම මිල යාන්ත්‍රණය නැමැති සම්බන්ධීකරණ යාන්ත්‍රණයෙන් විසඳන ආර්ථිකයකි. ප්‍රායෝගිකව ධනවාදී අර්ථ ක්‍රමයක් තුළම වෙළඳපොළ අර්ථ ක්‍රමයක් ක්‍රියාත්මක වේ.

- සමාජවාදී අර්ථ ක්‍රමයක් යනු සියලූ සම්පත් රජය සතු අර්ථ ක්‍රමයකි. සැලසුම් ආර්ථිකයක් යනු සම්පත් බෙදා හැරීම මධ්‍ය සැලසුම් යාන්ත්‍රණයෙන් සිදුවන ආර්ථිකයකි. ප්‍රායෝගිකව සැලසුම් ආර්ථිකයක් සමාජවාදී ආර්ථිකයකම ක්‍රියාත්මක වේ.

- තවද ධනවාදී හෝ වෙළඳපොළ ලෙසත් සමාජවාදී හෝ සැලසුම් ලෙසත් ආර්ථික පද්ධතීන් පැහැදිලිව වෙන් කළ නොහැකි අතර මිශ්‍ර ආර්ථික වශයෙන් ආර්ථික සංකලනය වී පවතී.

- සමහර ආර්ථික පද්ධතීන්වල සම්පත් හිමිකම රජය සතු අතර, සම්පත් බෙදා හැරීම මිල යාන්ත්‍රණයෙන් සිදු වේ. මෙවැනි ආර්ථික සමාජවාදී වෙළඳපොළ ආර්ථික ක්‍රම වශයෙන් හඳුන්වයි.

- සමහර ආර්ථික පද්ධතීන් වල සම්පත් හිමිකම පෞද්ගලික අංශය සතුවේ. නමුත් සුභසාධනය වෙනුවෙන් නිදහස් ව්‍යවසාය සහ නිදහස් තේරීම යම් මට්ටමකට සීමා වේ. මෙවැනි ආර්ථික ක්‍රම සමාජීය වෙළඳපොළ ආර්ථික ක්‍රම නම් වේ.

(කරුණු 04 කට ලකුණු 04 ක්)

# "අ" උපකොටස

02. i. වෙළෙඳපොළ සමතුලිතයක දැකිය හැකි විවිධ ලක්ෂණ මොනවාද? (ලකුණු 03)

ii. සැපයුම් නීතිය සඳහා බලපාන සාධක මොනවාද? එම සාධක මත සැපයුම් නීතිය ක්‍රියාත්මක වන්නේ කෙසේද? (ලකුණු 04)

iii. අවම මිල ප්‍රතිපත්තියක් සාර්ථකව ක්‍රියාත්මක කිරීම සඳහා භාවිතා කල හැකි විවිධ මිල ආධාරක ප්‍රතිපත්ති හඳුන්වා, එම ප්‍රතිපත්ති පාරිභෝගික අතිරික්තය, නිෂ්පාදන අතිරික්තය හා රජයේ වියදම යනාදිය සම්බන්ධයෙන් සන්සන්දනය කරන්න. (ලකුණු 06)

iv. එක්තරා භාණ්ඩයක ඉල්ලුම් හා සැපයුම් ලේඛණ පහත දැක්වේ

| මිල (රු.) | ඉල්ලුම් ප්‍රමාණය (ඒකක) | සැපයුම් ප්‍රමාණය (ඒකක) |
|---|---|---|
| 10 | 300 | 30 |
| 20 | 200 | 80 |

(අ) වෙළෙඳපොළ සමතුලිත මිල හා ප්‍රමාණය ගණනය කරන්න.

(ආ) රජය විසින් ඒකකයක් මත රු. 3.00 ක නිෂ්පාදන සහනාධාරයක් ලබාදුනහොත් වෙළෙඳපොළේ මිල සහ ප්‍රමාණය කොපමණද?

(ඇ) සහනාධාරයෙන් පසු නිෂ්පාදක හා පාරිභෝගික අතිරික්තයන් ගණනය කරන්න.

(ඈ) සහනාධාරයේ සම්පත් නාස්තිය කොපමණද? (ලකුණු 07)

i. වෙළෙඳපොළ සමතුලිතයක දැකිය හැකි විවිධ ලක්ෂණ මොනවාද?

(ලකුණු 03)

- සැලසුම්කළ වෙළඳපොළ ඉල්ලුම සැලසුම්කළ වෙළඳපොළ සැපයුමට සමාන වීම.
- අධි ඉල්ලුමක් හෝ අධි සැපයුමක් නොතිබීම.
- ගැණුම්කරුවන් හා විකුණුම්කරුවන් පවතින මිලට එකගව / තෘප්තිමත්ව සිටීම.
- පවතින මිල වෙනස් නොවීමේ ප්‍රවණතාවක් පැවතීම.

(කරුණු 03 කට ලකුණු 03 ක්)

**ii. සැපයුම් නීතිය සඳහා බලපාන සාධක මොනවාද? එම සාධක මත සැපයුම් නීතිය ක්‍රියාත්මක වන්නේ කෙසේද? (ලකුණු 04)**

- සැපයුම් නීතිය සඳහා බලපාන සාධක දෙකක් පවතී.

  1. ලාභය / ලාභය මත පදනම් වූ සැපයුම්කරුවන්ගේ කැමැත්ත.
  2. වැඩිවන ආවස්ථික පිරිවැය නීතිය.

(ලකුණු 02)


- භාණ්ඩයක මිල වැඩිවන විට අනෙකුත් සාධක නොවෙනස්ව පවතින නිසා ලාභය වැඩිවේ. එවිට සැපයුම්කරුවන් වැඩි ප්‍රමාණයක් සපයයි. තවද භාණ්ඩයක සැපයුම් ප්‍රමාණය වැඩිකරන විට වැඩිවන ආවස්ථික පිරිවැය නීතියට අනුව ආවස්ථික පිරිවැය වැඩිවේ. එම නිසා වැඩිවන ආවස්ථික පිරිවැය භාණ්ඩයේ මිල වැඩිවීම මගින් ආවරණය වේ නම් පමණක් සැපයුම් ප්‍රමාණය අඛණ්ඩව වැඩි කරයි. (ලකුණු 02)

**iii. අවම මිල ප්‍රතිපත්තියක් සාර්ථකව ක්‍රියාත්මක කිරීම සඳහා භාවිතා කල හැකි විවිධ මිල ආධාරක ප්‍රතිපත්ති හඳුන්වා, එම ප්‍රතිපත්ති පාරිභෝගික අතිරික්තය, නිෂ්පාදන අතිරික්තය හා රජයේ වියදම යනාදිය සම්බන්ධයෙන් සන්සන්දනය කරන්න. (ලකුණු 06)**

ප්‍රධාන මිල ආධාරක ප්‍රතිපත්ති දෙකක් පවතී.

1. අධි සැපයුම් මිලදී ගැනීම
2. ඌන පූර්ණ ගෙවීමේ ක්‍රමයක් ක්‍රියාත්මක කිරීම (ලකුණු 02)

අධි සැපයුම මිලදී ගැනීමේ ක්‍රමයේදී රජයේ අවම මිල යටතේ මුළු සැපයුම් ප්‍රමාණයෙන් ඉල්ලුම ප්‍රමාණයට අමතරව ඇති සැපයුම් ප්‍රමාණය අවම මිල යටතේ රජය විසින් මිලදී ගනී. ඌන පූර්ණ ගෙවීමේ ක්‍රමය යටතේදී අවම මිල යටතේ ඇති මුළු සැපයුම වෙළඳපොලේ තීරණය වන මිලකට සම්පූර්ණයෙන්ම අලෙවි වීමට ඉඩ හැර වෙළඳපොළ මිලත් අවම මිලත් අතර වෙනස රජය විසින් නිෂ්පාදකයාට ලබාදේ.




- අධි සැපයුම මිලදී ගැනීමේ රජයේ මුළු වියදම = FBHG
- ඌණ පූර්ණ ගෙවීමේ ක්‍රමයේදී රජයේ මුළු වියදම = ABCE

(ලකුණු 02)

| | පාරිභෝගික අතිරික්තය | නිෂ්පාදන අතිරික්තය | රජයේ මුළු වියදම |
|---|---|---|---|
| **අධි සැපයුම මිලදී ගැනීම** | අඩු වේ | වැඩි වේ | සාපේක්ෂව අඩු අගයකි |
| **ඌණ පූර්ණ ගෙවීමේ ක්‍රමය** | වැඩි වේ. | එම ප්‍රමාණයෙන්ම වැඩි වේ | සාපේක්ෂව වැඩි අගයකි |

(ලකුණු 02)

**iv. එක්තරා භාණ්ඩයක ඉල්ලුම් හා සැපයුම් ලේඛණ පහත දැක්වේ**

| මිල (රු.) | ඉල්ලුම් ප්‍රමාණය (ඒකක) | සැපයුම් ප්‍රමාණය (ඒකක) |
|---|---|---|
| 10 | 300 | 30 |
| 20 | 200 | 80 |

**(අ) වෙළෙඳපොළ සමතුලිත මිල හා ප්‍රමාණය ගණනය කරන්න.**

**(ආ) රජය විසින් ඒකකයක් මත රු. 3.00 ක නිෂ්පාදන සහනාධාරයක් ලබාදුනහොත් වෙළෙඳපොළේ මිල සහ ප්‍රමාණය කොපමණද?**

**(ඇ) සහනාධාරයෙන් පසු නිෂ්පාදක හා පාරිභෝගික අතිරික්තයන් ගණනය කරන්න.**

**(ඈ) සහනාධාරයේ සම්පත් නාස්තිය කොපමණද? (ලකුණු 07)**

(අ) Qd = 400 – 10p, Qs = - 20 + 5p

සමතුලිත මිල = රු. 28

සමතුලිත ප්‍රමාණය = ඒකක 120 (ලකුණු 02)

(ආ) වෙළඳපොළ මිල = රු. 27

වෙළඳපොළ ප්‍රමාණය = ඒකක 130 (ලකුණු 02)

(ඈ)


නිෂ්පාදන අතිරික්තය = $\frac{(30 - 4) * 130}{2}$ = රු. 1690

පාරිභෝගික අතිරික්තය = $\frac{(40 - 27) * 130}{2}$ = රු. 845

(ලකුණු 02)

(ඉ) සම්පත් නාස්තිය = $\frac{(30 - 27) * 10}{2}$ = රු. 15

(ලකුණු 01)



# “අ” උපකොටස

03. i. ගිණුම්කරණ ලාභය සහ ආර්ථික ලාභය අතර වෙනස කුමක්ද? ව්‍යාපාරික තීරණ ගැනීමේදී එම සංකල්ප දෙකේ වැදගත්කම අගය කරන්න. (ලකුණු 04)

ii. ප්‍රමාණික ලාභය යනු කුමක්ද? ප්‍රමාණික ලාභය ආර්ථික විද්‍යාවේ ස්ථාවර පිරිවැයක් ලෙස සලකනු ලබන්නේ ඇයි? පැහැදිලි කරන්න. (ලකුණු 04)

iii. පූර්ණ තරඟකාරී ආයතනයක් කෙටි කාලයේදී ආර්ථික අලාභයක් යටතේ වුවද නිෂ්පාදනය කරනු ලබන්නේ ඇයි? සුදුසු රූප සටහන් භාවිතයෙන් පැහැදිලි කරන්න. (ලකුණු 04)

iv. ඒකාධිකාරී තරඟ වෙළෙඳපොළක ආයතන විශාල සංඛ්‍යාවක් තිබුණද, එක් ආයතනයකට මිල සාදන්නෙකු ලෙස ක්‍රියාකල හැක්කේ ඇයි? පැහැදිලි කරන්න. (ලකුණු 04)

v. පූර්ණ තරඟකාරී වෙළෙඳපොළක සිටින ආයතනයක් තම භාණ්ඩ ඒකකයක් රු, 40 කට ඒකක 100 ක් සතියකදී අලෙවි කරයි. ආයතනයේ ආන්තික පිරිවැය, සාමාන්‍ය මුළු පිරිවැය සහ සාමාන්‍ය විචල්‍ය පිරිවැය පිළිවෙලින් රු. 35, රු. 42 සහ රු. 32 වේ.

(අ) ආයතනය කෙටි කාලයේ වසා දමනු ලැබේද? නැතහොත් තව දුරටත් නිෂ්පාදනය කරන්නේද? පැහැදිලි කරන්න.

(ආ) ආයතනයේ වර්තමාන නිමවුම් මට්ටමේදී ලාභය උපරිම හෝ අලාභය අවම වී ඇත්ද? පැහැදිලි කරන්න.

(ඇ) ආයතනයේ මුළු ස්ථාවර පිරිවැය කොපමණද? (ලකුණු 04)

## i. ගිණුම්කරණ ලාභය සහ ආර්ථික ලාභය අතර වෙනස කුමක්ද? ව්‍යාපාරික තීරණ ගැනීමේදී එම සංකල්ප දෙකේ වැදගත්කම අගය කරන්න. (ලකුණු 04)

මුළු අයභාරය හා ගිණුම්කරණ පිරිවැය අතර වෙනස ගිනුම්කරණ ලාභය වේ.

| |
|---|
| ගිණුම්කරණ ලාභය = මුළු අයභාරය -ගිණුම්කරණ පිරිවැය |

(ලකුණු 01)

මුළු අයභාරය සහ ආර්ථික පිරිවැය අතර වෙනස ආර්ථික ලාභය වේ. (ලකුණු 01)

| |
|---|
| ආර්ථික ලාභය = මුළු අයභාරය - ආර්ථික පිරිවැය |
| (ආර්ථික පිරිවැය = ගිණුම්කරණ පිරිවැය + ආවස්ථික පිරිවැය) |

ආයතනයක වර්තමාන මෙහෙයුම් කටයුතු වල සාර්ථකත්වය මැනීමට ගිණුම්කරණ ලාභය වැදගත් වේ. ප්‍රතිපත්ති තීරණ ගැනීම සඳහා ආර්ථික ලාභය වැදගත් වේ. උදාහරණ ලෙස යම් ව්‍යාපෘතියක ගිණුම්කරන ලාභයක් පවතින්නේ නම් එහි අදහස වර්තමාන මෙහෙයුම් කටයුතු වලින් ලාභ පවතින බවයි. නමුත් ආර්ථික අලාභයක් පවතී නම් එහි අදහස වර්තමාන ව්‍යාපාර තීරණ දිගුකාලීනව නුසුදුසු බවයි. එනම් හොඳම විකල්ප අවස්ථාවෙන් ව්‍යවසායකයාට වැඩි ලාභයක් ලැබෙන බවයි. (ලකුණු 02)


**ii. ප්‍රමාණික ලාභය යනු කුමක්ද? ප්‍රමාණික ලාභය ආර්ථික විද්‍යාවේ ස්ථාවර පිරිවැයක් ලෙස සලකනු ලබන්නේ ඇයි? පැහැදිලි කරන්න. (ලකුණු 04)**

- ප්‍රාමාණික ලාභය යනු යම් ව්‍යවසායකයෙකුට වර්තමාන ව්‍යාපාරය තුළ අඛණ්ඩව රැඳී සිටීම සඳහා එම ව්‍යාපාරයෙන් අපේක්ෂා කරන අවම ලාභයයි. (ලකුණු 01)

- ප්‍රාමාණික ලාභය නොතිබුණහොත් ව්‍යවසායකයා එම ව්‍යාපාරය වසා දමනු ලැබේ. ඒ අනුව ව්‍යාපාරයේ දෘෂ්ඨි කෝණයෙන් ප්‍රාමාණික ලාභය යනු ව්‍යවසායකත්වය නැමැති සාධකය වෙනුවෙන් කරනු ලබන ගෙවීමයි. එම නිසා ප්‍රාමාණික ලාභය නිෂ්පාදන පිරිවැයේ කොටසක් ලෙස සලකනු ලැබේ. (ලකුණු 01)

- ප්‍රාමාණික ලාභය ව්‍යවසායකයාගේ ආවස්ථික පිරිවැයට සමාන වේ. ඒ අනුව ප්‍රාමාණික ලාභය නිමවුම් ඒකක සංඛ්‍යාව අනුව සෘජුව වෙනස් නොවන අතර, නිමවුම් මට්ටම ශුන්‍ය වුවද දැකගත හැකිය. එම නිසා ප්‍රාමාණික ලාභය ස්ථාවර පිරිවැයක් ලෙස සලකනු ලැබේ. (ලකුණු 02)

**iii.** පූර්ණ තරඟකාරී ආයතනයක් කෙටි කාලයේදී ආර්ථික අලාභයක් යටතේ වුවද නිෂ්පාදනය කරනු ලබන්නේ ඇයි? සුදුසු රූප සටහන් භාවිතයෙන් පැහැදිලි කරන්න. (ලකුණු 04)



ඉහත රූපසටහනේ පරිදි සමතුලිත ප්‍රමාණය ($Q_E$) වන අවස්ථාවක ආයතනයේ මිල සාමාන්‍ය මුළු පිරිවැයට වඩා අඩු නිසා ආර්ථික අලාභයක් පවතී. නමුත් මිල සාමාන්‍ය විචල්‍ය පිරිවැයට වඩා වැඩි නිසා තව දුරටත් කෙටි කාලයේ නිෂ්පාදන කටයුතු සිදු කරයි. (ලකුණු 01)

මෙවැනි අවස්ථාවක කටයුතු කරන ආයතනයක් කෙටි කාලයේදී වසා දැමුවහොත්, මුළු ස්ථාවර පිරිවැය අලාභයක් බවට පත් වේ. නමුත් නිෂ්පාදනය සිදු කලහොත්, මුළු ස්ථාවර පිරිවැයෙන් කොටසක් පමණක් අලාභය බවට පත්වේ. එම නිසා ආර්ථික අලාභයක් පැවතුණද අලාභය අවම කිරීම සඳහා කෙටිකාලීනව තව දුරටත් නිෂ්පාදන කටයුතු සිදු කරයි. (ලකුණු 02)

**iv. ඒකාධිකාරී තරඟ වෙළෙඳපොළක ආයතන විශාල සංඛ්‍යාවක් තිබුණද, එක් ආයතනයකට මිල සාදන්නෙකු ලෙස ක්‍රියාකල හැක්කේ ඇයි? පැහැදිලි කරන්න. (ලකුණු 04)**

- ඒකාධිකාරි තරග ආයතනයකට මිල සාදන්නකු ලෙස ක්‍රියා කළ හැක්කේ භාණ්ඩ ප්‍රභේධනයක් පවතින නිසාය.

- ඒකාධිකාරි තරග ආයතනයක් භාණ්ඩ ප්‍රභේධයනය සඳහා විවිධ උපක්‍රම භාවිතා කරයි.

1. හැඩය, වර්ණය, අංගෝපාංග වැනි භෞතික ලක්ෂණ මගින්
2. පාරිභෝගිකයින්ට සැලකීම, සේවක නිල ඇඳුම් වැනි මානව ප්‍රාග්ධනය මගින්
3. ප්‍රචාරණය, ප්‍රවර්ධනය, අලෙවියෙන් පසු සේවා වැනි අලෙවිකරණ ක්‍රම මගින්
4. නිවසටම නොමිලයේ ලබාදීම, අන්තර්ජාලය මගින් අලෙවිකිරීම වැනි බෙදාහැරීමේ ක්‍රමවේද මගින්

(කරුණු 03 කට ලකුණු 03 ක්)

**v. පූර්ණ තරඟකාරී වෙළෙඳපොළක සිටින ආයතනයක් තම භාණ්ඩ ඒකකයක් රු, 40 කට ඒකක 100 ක් සතියකදී අලෙවි කරයි. ආයතනයේ ආන්තික පිරිවැය, සාමාන්‍ය මුළු පිරිවැය සහ සාමාන්‍ය විචල්‍ය පිරිවැය පිළිවෙලින් රු. 35, රු. 42 සහ රු. 32 වේ.**

**(අ) ආයතනය කෙටි කාලයේ වසා දමනු ලැබේද? නැතහොත් තව දුරටත් නිෂ්පාදනය කරන්නේද? පැහැදිලි කරන්න.**

**(ආ) ආයතනයේ වර්තමාන නිමවුම් මට්ටමේදී ලාභය උපරිම හෝ අලාභය අවම වී ඇත්ද? පැහැදිලි කරන්න.**

**(ඇ) ආයතනයේ මුළු ස්ථාවර පිරිවැය කොපමණද? (ලකුණු 04)**

(අ) මිල සාමාන්‍ය විචල්‍ය පිරිවැයට වඩා වැඩි නිසා තව දුරටත් කෙටිකාලයේදී නිෂ්පාදන කටයුතු සිදු කරයි. නමුත් ආර්ථික අලාභයක් පවතී. (ලකුණු 01)

(ආ) මෙය ආර්ථික අලාභයක් පවතින අවස්ථාවකි. නමුත් අලාභය අවම වී නොපවතී. එනම් ආයතනය සමතුලිතයේ නොපවතී. මිල, ආන්තික පිරිවැයට වඩා වැඩි නිසා අලාභය අවම කිරීමට නම් තව දුරටත් නිමවුම වැඩි කල යුතුය. (ලකුණු 02)

(ඇ) සාමාන්‍ය ස්ථාවර පිරිවැය = 42 -32 =10

මුළු ස්ථාවර පිරිවැය = රු. 10 x ඒකක 100 = රු. 1000

(ලකුණු 01)

# "අ" උපකොටස

04. i. 2015 වර්ෂයේ සිට ක්‍රියාත්මක වන පරිදි ලංකාවේ ජාතික ගිණුම්කරණ රාමුව සඳහා හඳුන්වා දී ඇති ප්‍රධාන වෙනස්කම් මොනවාද? (ලකුණු 04)

ii. රටක ජාතික ගිණුම්කරණ දත්ත වල විශ්වාසනීය බාවය සීමා කරන සාධක මොනවාද? (ලකුණු 04)

iii. එක්තරා කල්පිත ආර්ථිකයක් සම්බන්ධයෙන් යම් වර්ෂයක් සඳහා පහත සඳහන් ජාතික ගිණුම්කරණ දත්ත ඔබවෙත සපයා ඇත. (සංඛ්‍යා රු.මිලියන වලින්)

| අයිතමය | වටිනාකම |
|---|---|
| සාංගමික ලාභ | 4,000 |
| බදු කුලී ආදායම් | 3,500 |
| ශුද්ධ අපනයන | 1,500 |
| ප්‍රාග්ධන පරිභෝජනය | 500 |
| කුටුම්භ පරිභෝජනය | 12,000 |
| විදේශ ශුද්ධ සාධක ආදායම | 1,000 |
| ශුද්ධ පොලිය | 1,000 |
| වැටුප් සහ වේතන | 5,000 |
| ස්වයං රැකියා කරන්නවුන්ගේ ආදායම | 6,000 |
| නොබෙදූ ලාභ | 1,000 |
| සාංගමික නොවන ව්‍යාපාරික ආදායම | 4,000 |
| ලාභාංශ | 2,500 |
| භාණ්ඩ හා සේවා මත රාජ්‍ය වියදම | 3,000 |
| කුටමුභ සංක්‍රාම | 200 |
| විදේශ ශුද්ධ සංක්‍රාම | 500 |
| ශුද්ධ වක්‍ර බදු | 100 |

ඉහත තොරතුරු ආශ්‍රයෙන් පහත සඳහන් දෑ ගණනය කරන්න.

(අ) ශුද්ධ දේශීය ආදායම

(ආ) වෙළෙඳ මිලට දළ ජාතික නිෂ්පාදිතය

(ඇ) වැයකළ හැකි දළ ජාතික ආදායම

(ඈ) කුටුම්භ ඉතුරුම්

(ඉ) ජාතික ඉතුරුම්

(ඊ) දළ ආයෝජන (ලකුණු 12)

**i. 2015 වර්ෂයේ සිට ක්‍රියාත්මක වන පරිදි ලංකාවේ ජාතික ගිණුම්කරණ රාමුව සඳහා හඳුන්වා දී ඇති ප්‍රධාන වෙනස්කම් මොනවාද? (ලකුණු 04)**

- 2002 වර්ෂයේ පැවැති පාද වර්ෂය 2010 වශයෙන් වෙනස් කිරීම
නිෂ්පාදිත ප්‍රවේශය යටතේ දළ දේශීය නිෂ්පාදිතය නව ආංශික සංයුතියක් යටතේ වර්ග කිරීම

1. මූල්‍ය නොවන සමාගම්
2. මූල්‍ය සමාගම්
3. සාමාන්‍ය රාජ්‍ය
4. ගෘහ ඒකක (කුටුම්භ)
5. කුටුම්භ සඳහා සේවා සපයන ලාභ නොමැති ආයතන

- නිෂ්පාදන පරාසය පුළුල් කිරීම
- මෙහිදී පෞද්ගලික ප්‍රාග්ධනය, පෞද්ගලික සෞඛ්‍යය වැනි ක්ෂේත්‍ර සම්පූර්ණයෙන් ආවරණය කිරීමට අපේක්ෂා කරයි.
- ආවරණය නොවූ ගෘහ ඒකක කටයුතු පුළුල් කිරීම
උදා:- ගෘහ නිර්මාණ ශිල්පය, රූපලාවන්‍ය ශිල්පය
- ආදායම් ප්‍රවේශයෙන් ජාතික ගිණුම් සැකසීම
- වියදම් ප්‍රවේශය තුළිනුත් කාර්තුමය වශයෙන් ජාතික ගිණුම්කරණ කටයුතු සිදු කරයි.
- සාධක පිරිවැය මිල ඉවත් කර ඒ වෙනුවට මූලික මිල හඳුන්වා දීම.

(කරුණු 04 කට ලකුණු 04 ක්)

**ii. රටක ජාතික ගිණුම්කරණ දත්ත වල විශ්වාසනීය බාවය සීමා කරන සාධක මොනවාද? (ලකුණු 04)**

- සියලුම ඵලදායි ආර්ථික කටයුතු ජාතික ආර්ථික ක්‍රියාවලියට ඇතුලත් නොකිරීම.

උදා:-

1. ගෘහනියගේ සේවය
2. සැගවුණු ආර්ථික කටයුතු
3. ස්වේච්ඡා සේවාවන්
4. ස්වයං සේවාවන්

- ද්විගණන හා බහුගනණ දෝෂ සිදුවීම.
- විවේක කාලය දළදේශීය නිෂ්පාදිතය ගණනය කිරීමට සළකා නොබැලීම.
- නිෂ්පාදන ක්‍රියාවලිය තුළින් පරිසරයට වන බලපෑම ජාතික ගිණුම්කරණ ක්‍රියාවලිය තුළින් සැලකිල්ලට නොගැනීම.

(ලකුණු 01 බැගින් ලකුණු 04 )

**iii.** **එක්තරා කල්පිත ආර්ථිකයක් සම්බන්ධයෙන් යම් වර්ෂයක් සඳහා පහත සඳහන් ජාතික ගිණුම්කරණ දත්ත ඔබවෙත සපයා ඇත. (සංඛ්‍යා රු.මිලියන වලින්)**

| අයිතමය | වටිනාකම |
|---|---|
| සාංගමික ලාභ | 4,000 |
| බදු කුලී ආදායම් | 3,500 |
| ශුද්ධ අපනයන | 1,500 |
| ප්‍රාග්ධන පරිභෝජනය | 500 |
| කුටුම්භ පරිභෝජනය | 12,000 |
| විදේශ ශුද්ධ සාධක ආදායම | 1,000 |
| ශුද්ධ පොලිය | 1,000 |
| වැටුප් සහ වේතන | 5,000 |
| ස්වයං රැකියා කරන්නවුන්ගේ ආදායම | 6,000 |
| නොබෙදූ ලාභ | 1,000 |
| සාංගමික නොවන ව්‍යාපාරික ආදායම | 4,000 |
| ලාභාංශ | 2,500 |
| භාණ්ඩ හා සේවා මත රාජ්‍ය වියදම | 3,000 |
| කුටමුභ සංක්‍රාම | 200 |
| විදේශ ශුද්ධ සංක්‍රාම | 500 |
| ශුද්ධ වක්‍ර බදු | 100 |

ඉහත තොරතුරු ආශ්‍රයෙන් පහත සඳහන් දෑ ගණනය කරන්න.

(අ) ශුද්ධ දේශීය ආදායම

(ආ) වෙළෙඳ මිලට දළ ජාතික නිෂ්පාදිතය

(ඇ) වැයකළ හැකි දළ ජාතික ආදායම

(ඈ) කුටුම්භ ඉතුරුම්

(ඉ) ජාතික ඉතුරුම්

(ඊ) දළ ආයෝජන (ලකුණු 12)

(අ) ශුද්ධ දේශීය ආදායම (සාධක පිරිවැය මිලට ශුද්ධ දේශීය නිෂ්පාදිතය)

= 4000 + 3500 + 1000 + 5000 + 6000+ 4000

= 23500 (රු. මිලියන)

(ආ) වෙළඳ මිලට ද.ජා.නි. = 23500 +100 + 500 +1000

= 25100 (රු. මිලියන)

(ඇ) වැයකල හැකි දළ ජාතික ආදායම = 25100 + 500

= 25600 (රු. මිලියන)

(ඈ) වැයකල හැකි කුටුම්භ ආදායම = (23500 + 1000) - (1500) + (200)

= 23200 (රු. මිලියන)

කුටුම්භ ඉතුරුම් = 23200 - 12000

= 11200 (රු. මිලියන)

(ඉ) ජාතික ඉතුරුම් = වැයකල හැකි දළ ජාතික ආදායම - (C + G)

= 25600 - (12000 + 3000)

= 10600 (රු. මිලියන)

(ඊ) ජාතික ඉතුරුම් = I + ගෙවුම් ශේෂයේ ජංගම ගිණුමේ ශේෂය

10600 = I + (1500 + 1000 + 500)

I (ආයෝජනය) = 7600 (රු. මිලියන)

**(කොටසකට ලකුණු 02 බැගින් ලකුණු 12 )**

# “අ” උපකොටස

05. **i.** සාර්ව ආර්ථික සමතුලිතයක දැකිය හැකි “විදීම්” හා “කාන්දුවීම්” යන සංකල්ප පැහැදිලි කරන්නි (ලකුණු 04)

**ii.** “සරල ආර්ථිකයක සැලසුම් කළ ආයෝජනය, සැලසුම්කළ ඉතුරුම් වලට වඩා වැඩිනම්, සාර්ව ආර්ථික සමතුලිතයක් ඉදිරියේදී කෙසේවත් ඇතිවිය නොහැක.” එගවේද? පැහැදිලි කරන්න. (ලකුණු 04)

**iii.** උද්ධමනාත්මක හා ප්‍රතිගමනාත්මක පරතරයන් අතර වෙනස පැහැදිලි කරන්න. (ලකුණු 04)

**iv.** රජය විසින් උපයාගත් මුළු බදු ආදායම, භාණ්ඩ හා සේවා මිලදී ගැනීම සඳහා වියදම් කරන ලදී. මෙමගින් සමතුලිත නිමවුමට බලපෑමක් ඇති නොවේ. එකඟවේද? පැහැදිලි කරන්න. (ලකුණු 04)

**v.** වක්‍ර බදු සහ සහනාධාර නොමැති ආර්ථිකයක් සම්බන්ධයෙන් පහත සඳහන් තොරතුරු ඔබවෙත සපයා ඇත.

| අයිතමය | වටිනාකම (රු. මිලියන) |
|---|---|
| දළ ආයෝජනය | 1,000 |
| රජයේ මිලදී ගැනීම් | 3,500 |
| කුටුම්භ පරිභෝජනය | 5,000 |
| ශුද්ධ ආයෝජනය | 400 |
| දළ දේශීය නිෂ්පාදිතය (පවත්නා මිලට) | 9,000 |
| අයවැය හිඟය | 100 |

පහත සඳහන් දෑ ගණනය කරන්න.

(අ) ශුද්ධ දේශීය නිෂ්පාදිතය

(ආ) ශුද්ධ අපනයන

(ඇ) ශුද්ධ බදු (සෘජු බදු - සංක්‍රාම)

(ඈ) වැයකල හැකි පෞද්ගලික ආදායම (ලකුණු 04)

## i. සාර්ව ආර්ථික සමතුලිතයක දැකිය හැකි "විදීම්" හා "කාන්දුවීම්" යන සංකල්ප පැහැදිලි කරන්න (ලකුණු 04)

විදීම්

- රටක පවතින සමාහාර ඉල්ලුම් ප්‍රමාණය ප්‍රසාරණය විය හැකි ආකාරයට සිදුවන එකතුවීම් විදීම් වශයෙන් හඳුන්වයි.

- විදීම් නිසා රටක සමාහාර වියදම/ඉල්ලුම ප්‍රසාරණය වී නිමැවුම් මට්ටම හා සේවා නියුක්තිය ප්‍රසාරණය වේ.

උදාහරණ :- ආයෝජනය, රජයේ මිලදී ගැනීම්, අපනයන

(ලකුණු 02)

කාන්දුවීම්

- රටක විවිධ පාර්ශවයන් සාධක ආදායම් ලෙස උපයන මුළු ආදායමෙන් නැවත භාණ්ඩ සහ සේවා මිලදී ගැනීමට වියදම් නොකරන කොටස කාන්දුවීම් වශයෙන් හඳුන්වයි.

- කාන්දුවීම් නිසා රටක සමාහාර ඉල්ලුම සංකෝචණය වී, නිමවුම් මට්ටම සහ සේවා නියුක්තිය සංකෝචනය වේ.

උදාහරණ :- ඉතුරුම්, බදු, ආනයන

(ලකුණු 02)

ii. "සරල ආර්ථිකයක සැලසුම් කළ ආයෝජනය, සැලසුම්කළ ඉතුරුම් වලට වඩා වැඩිනම්, සාර්ව ආර්ථික සමතුලිතයක් ඉදිරියේදී කෙසේවත් ඇතිවිය නොහැක." එකඟ වේද? පැහැදිලි කරන්න. (ලකුණු 04)

- එකග නොවේ. ඉදිරියේදී ආර්ථිකය සමතුලිතය කරා ගමන් කරයි. (ලකුණු 01)

- සරල ආර්ථිකයක සැලසුම්කල ආයෝජනය සැලසුම්කල ඉතුරුම් වලට වඩා වැඩිවන විට ආර්ථිකයේ සමාහාර ඉල්ලුම/සමාහාර වියදම සමාහාර නිමවුමට වඩා වැඩි අගයකි. එවිට සමාහාර වියදමට උචිත ලෙස සමාහාර නිමැවුම ප්‍රසාරණය වේ. (ලකුණු 01)


- සමාහාර වියදම සමාහාර නිමවුමට වඩා වැඩි විට, ආයතන වල තොග මට්ටම් වල හිගයක් ඇතිවේ. එවිට ආයතන වල සැලසුම්කල තොග මට්ටම් ලබා ගැනීම සඳහා නිමවුම ප්‍රසාරණය කරයි. නිමවුම් මට්ටම ප්‍රසාරණය කරන විට ඉතුරුම් ඉහළ යයි. යම් අවස්ථාවක ඉතුරුම් ආයෝජන වලට සමාන වන තුරුම, එනම් සමතුලිතයට ලගාවන තුරුම නිමවුම් මට්ටම ඉහළ දමයි. (ලකුණු 02)

**iii. උද්ධමනාත්මක හා ප්‍රතිගමනාත්මක පරතරයන් අතර වෙනස පැහැදිලි කරන්න.**

**(ලකුණු 04)**

- රටක පූර්ණ සේවා නියුක්ති මට්ටම අභිබවමින් සමාහාර ඉල්ලුම පවතින විට පූර්ණ සේවා නියුක්ති මට්ටමට වඩා සමාහාර ඉල්ලුමේ පවතින ප්‍රමාණය .උද්ධමනාත්මක පරතරය නම් වේ. මෙම කලාපය තුළ සමාහාර ඉල්ලුම වැඩිවීමේදී විශාල උද්ධමනයක් ආර්ථිකයේ ඇති වේ. (ලකුණු 01)

- රටක පූර්ණ සේවා නියුක්ති මට්ටමට වඩා අඩුවෙන් සමාහාර ඉල්ලුම පවතින විට, එම පූර්ණ සේවා නියුක්ති මට්ටමට වඩා සමාහාර ඉල්ලුමේ අඩු ප්‍රමාණය ප්‍රතිගමනාත්මක පරතරය වශයෙන් හඳුන්වයි. මෙම කලාපයේදී සමාහාර ඉල්ලුම වැඩිවීමෙන් විශාල උද්ධමනකාරී තත්වයක් ඇති නොවේ. (ලකුණු 01)




YF = පූර්ණ සේවා නියුක්ති නිමැවුම

AB = උද්ධමනාත්මක පරතරය

BC = ප්‍රතිගමනාත්මක පරතරය

(ලකුණු 02)

**iv. රජය විසින් උපයාගත් මුළු බදු ආදායම, භාණ්ඩ හා සේවා මිලදී ගැනීම සඳහා වියදම් කරන ලදී. මෙමගින් සමතුලිත නිමවුමට බලපෑමක් ඇති නොවේ. එකඟවේද? පැහැදිලි කරන්න. (ලකුණු 04)**

- එකග විය නොහැක. සමතුලිත නිමවුම මෙමගින් ප්‍රසාරණය වේ. (ලකුණු 01)

- රජය විසින් යම් බද්දක් පැන වූ විට එම ප්‍රමාණයෙන් වැයකළ හැකි ආදායම පහළ යයි. ආන්තික පරිභෝජන නැම්යාව අනුව වැයකළ හැකි ආදායමේ පහළ ගිය කොටසේ යම් ප්‍රසාරණයක් පමණක් පරිභෝජනය ලෙස අඩු වී සමාහාර වියදමෙන් අඩුවේ. රජය රුපියල් මිලියන 100 ක බදු පැනවූ විට ආන්තික පරිභෝජන නැම්යාව 0.75 ක් නම් සමාහාර ඉල්ලුමේ අඩු වීම රු. මිලියන 75 කි. නමුත් රජය විසින් උපයාගත් බදු මුදල සම්පූර්ණයෙන් භාණ්ඩ හා සේවා මිලදී ගැනීමට යොදවන විට එම ප්‍රමාණයෙන්ම සමාහාර ඉල්ලුම ඍජුව වැඩි වේ. ඉහත උදාහරණය අනුව සමාහාර ඉල්ලුම රුපියල් මිලියන 100 කින් ඉහළ යයි. ඒ අනුව සමාන ප්‍රමාණයේ බද්දත් සහ රාජ්‍ය වියදමත් සලකා බැලීමේදී බද්දේ සංකෝචනාත්මක බලපෑමට වඩා රජ්‍ය වියදමේ ප්‍රසාරණාත්මක බලපෑම ඉහළ නිසා සමතුලිත නිමවුම ඉහළ යයි. (ලකුණු 03)

**v. වක්‍ර බදු සහ සහනාධාර නොමැති ආර්ථිකයක් සම්බන්ධයෙන් පහත සඳහන් තොරතුරු ඔබවෙත සපයා ඇත.**

| **අයිතමය** | **වටිනාකම (රු. මිලියන)** |
|---|---|
| දළ ආයෝජනය | 1,000 |
| රජයේ මිලදී ගැනීම් | 3,500 |
| කුටුම්භ පරිභෝජනය | 5,000 |
| ශුද්ධ ආයෝජනය | 400 |
| දළ දේශීය නිෂ්පාදිතය (පවත්නා මිලට) | 9,000 |
| අයවැය හිඟය | 100 |

**පහත සඳහන් දෑ ගණනය කරන්න.**

**(අ) ශුද්ධ දේශීය නිෂ්පාදිතය**

**(ආ) ශුද්ධ අපනයන**

**(ඇ) ශුද්ධ බදු (ඍජු බදු - සංක්‍රාම)**

**(ඈ) වැයකල හැකි පෞද්ගලික ආදායම (ලකුණු 04)**

(අ) ප්‍රාග්ධන ක්ෂය වීම් = 1000 – 400

= රු. මිලියන 600

ශුද්ධ දේශීය නිෂ්පාදිතය = 9000 – 600

= රු. මිලියන 8400 **(ලකුණු 01)**

(ආ) Y = C + I + G + NX

9000 = 5000 + 1000 + 3500 + NX

9000 – 9500 = NX

ශුද්ධ අපනයන (NX) = රු. මිලියන – 500 **(ලකුණු 01)**

(ඇ) අයවැය ශේෂය = T – (G + R)

-100 = T – (3500 + R)

-100 = T – 3500 – R

3400 = T - R

ශුද්ධ බදු (T – R) = රු. මිලියන 3400 **(ලකුණු 01)**

(ඈ) වැයකල හැකි පෞද්ගලික ආදායම = 8400 – 3400

= රු. මිලියන 5000 **(ලකුණු 01)**

# "ආ" උපකොටස

06. i. ජාතික පාරිභෝගික මිල දර්ශකයේ වැදගත්කම සහ එහි ලක්ෂණ කෙටියෙන් දක්වන්න. (ලකුණු 06)

ii. මුදල් ඉලක්කකරන සහ උද්ධමන ඉලක්කකරන ප්‍රතිපත්තීන් දෙක අතර පවතින වෙනස කුමක්ද? (ලකුණු 04)

iii. ශ්‍රී ලංකාවේ මුදල් ප්‍රතිපත්තිය තුළ මෑත කාලීනව සිදුවූ නවීකරණයන් මොනවාද? පැහැදිලි කරන්න. (ලකුණු 06)

iv. එක්තරා බැංකු පද්ධතියක ශේෂ පත්‍රය පහත පරිදි ඔබ වෙත ලබාදී ඇත. ව්‍යවස්ථාපිත සංචිත අනුපාතය 20% ක් වේ.

| වගකීම් | (රු.බිලියන) | වත්කම් | (රු.බිලියන) |
|---|---|---|---|
| තැන්පතු | 100 | සංචිත | 15 |
| | | සුරැකුම්පත් | 25 |
| | | ණය | 60 |
| මුළු | 100 | මුළු | 100 |

පහත සඳහන් ප්‍රශ්න සඳහා පිළිතුරු සපයන්න.

(අ) බැංකු පද්ධතියකට අතිරේව ණය සැපයීමේ හැකියාවක් පවතීද? පැහැදිලි කරන්න.

(ආ) සියලු ගැලපුම් සිදු කිරීමෙන් පසු බැංකු පද්ධතියේ ශේෂ පත්‍රය දක්වන්න.

(ලකුණු 04)

**i. ජාතික පාරිභෝගික මිල දර්ශකයේ වැදගත්කම සහ එහි ලක්‍ෂණ කෙටියෙන් දක්වන්න. (ලකුණු 06)**

<u>වැදගත්කම</u>

දිවයිනෙහි පළාත් නවයෙහි ම ගෘහ ඒකකවල පරිභෝජන රටාවන් නිරූපණය වන පරිදි මෙම මිල දර්ශනය ගොඩ නගා ඇති නිසා ආර්ථිකයේ මිල ප්‍රවණතා සහ මිල විචලනයන් පිළිබඳ පුළුල් දැක්මක් සපයයි. ජාතික පාරිභෝගික මිල දර්ශකය ගණනය කිරීම හේතුවෙන්, ප්‍රතිපත්ති සම්පාදකයන්ට මිල ස්ථායිතාවය හා අනෙකුත් සාර්ව ආර්ථික ප්‍රවණතාවයන් පිළිබඳව වඩා දැනුවත් ප්‍රතිපත්ති තීරණ ගැනීම සඳහා අවස්ථාව සපයයි. (ලකුණු 02)

<u>ජාතික පාරිභෝජන මිල දර්ශනයේ මූලික ලක්ෂණ</u>

1. ශ්‍රී ලංකාවේ සෑම පළාතක්ම ආවරණය වන ආකාරයට නියැදිය තෝරා ගනී.
2. 2012/13 ගෘහ ඒකකයක ආදායම් හා වියදම් සමීක්ෂණය, "පදනම් සමීක්ෂණය" ලෙස භාවිතා කරයි.
3. දර්ශකයේ පදනම් වර්ෂය ලෙස 2013 යොදාගනී.
4. පදනම් වර්ෂයේ ගෘහ ඒකකයක සාමාන්‍ය මාසික පරිභෝජන වියදම රු. 32142.69 ක් වේ.
5. ප්‍රධාන භාණ්ඩ 12 ක් යටතේ අයිතම 407 ක් භාණ්ඩ හා සේවා පැසට ඇතුලත් කරයි.
6. ආහාර සඳහා මුළු වියදමෙන් 44.04% ක් බර තබනු ලැබේ.
7. දිවයිනේ එක් දිස්ත්‍රික්කයකින් මධ්‍යස්ථාන 03 බැගින් පිහිටුවා මිල ගණන් රැස් කරනු ලැබේ. (කරුණු 04 කට ලකුණු 04 ක්)

## ii. මුදල් ඉලක්කකරණ සහ උද්ධමන ඉලක්කකරණ ප්‍රතිපත්තීන් දෙක අතර පවතින වෙනස කුමක්ද? (ලකුණු 04)

<u>මුදල් ඉලක්කකරණ ප්‍රතිපත්ති</u>

- මුදල් ඉලක්කකරණ ප්‍රතිපත්ති යනු මුදල් සැපයුමේ වර්ධනය ඉලක්ක කර අනාගතයට පත්කර මිල ස්ථායිතා පවත්වාගෙන යාමයි.

- මෙහිදී මුදල් ගුණකය හරහා සංචිත මුදල් සමග බැඳී ඇති අතරමැදි ඉලක්කය වන පුළුල් මුදල් සමස්තය පාලනය කිරීම තුලින් අවසාන ඉලක්කය වන මිල ස්ථායිතාව ළඟා කර ගැනීම ගැනීම සිදු විය.

- මෙම රාමුව යටතේ මුදල් ප්‍රතිපත්තියේ මෙහෙයුම් ඉලක්කය වශයෙන් සංචිත මුදල් ක්‍රියාත්මක විය. මුදල් ඉලක්කකරණ රාමුව ක්‍රියාත්මක කිරීමේදී අපේක්ෂිත රාජ්‍ය මූල්‍ය හා ගෙවුම් තුලන වර්ධනයෙහි අපේක්ෂිත ආර්ථික වර්ධනයත්, අපේක්ෂිත උද්ධමන මට්ටමත් යනාදිය සෑම වසරකම මහ බැංකුව තම වැඩසටහන් වලදී සලකා බලයි.

(කරුණු 02 කට ලකුණු 02 ක්)

## උද්ධමන ඉලක්කකරණය

- උද්ධමන ඉලක්කකරණය යනු මහ බැංකුව විසින් රටක ඉලක්කගත උද්ධමන අනුපාතයක් ප්‍රකාශයට පත් කර, එයට ගැළපෙන ලෙස මුදල් සැපයුමේ වර්ධනය සකසා ගැනීමයි.

- උද්ධමන ඉලක්කකරණ ප්‍රතිපත්ති රාමුවක ප්‍රධාන ලක්ෂණ 3 ක් වෙයි.

1. සංඛ්‍යාත්මක උද්ධමන ඉලක්කයක් ප්‍රකාශයට පත් කිරීම
2. ඉදිරි දැක්මකින් යුක්තව මුදල් ප්‍රතිපත්ති තීරණ ගැනීම
3. ඉහළ මට්ටමක විනිවිදභාවය සහ වගවීම

(ලකුණු 02)

**iii. ශ්‍රී ලංකාවේ මුදල් ප්‍රතිපත්තිය තුළ මෑත කාලීනව සිදුවූ නවීකරණයන් මොනවාද? පැහැදිලි කරන්න. (ලකුණු 06)**


- ලෝකයේ විවිධ රටවල් මුදල් ඉලක්කකරණ රාමුවෙන් ඉවත්වීමේ ප්‍රවණතාවය සැලකිල්ලට ගනිමින් ශ්‍රී ලංකා මහ බැංකුව සිය මුදල් ප්‍රතිපත්ති රාමුව වැඩි දියුණු කරමින් එය නම්‍යශීලී උද්ධමන ඉලක්කකරණ රාමුවකට පරිවර්තනය කිරීමට කටයුතු කරමින් සිටී. (ලකුණු 01)

-අන්තර්කාලීන පියවරක් ලෙස මහ බැංකුව සිය මුදල් ප්‍රතිපත්තිය, මුදල් සමස්ත ඉලක්කකරණය සහ නම්‍යශීලී උද්ධමන ඉලක්කකරණය යන උපාය මාර්ග දෙකෙහිම ලක්ෂණ ඇතිව වැඩි දියුණු කළ මුදල් ප්‍රතිපත්ති රාමුවක් යටතේ ක්‍රියාත්මක කරයි. (ලකුණු 01)

- මහ බැංකුව මුදල් සමස්තය සඳහා ඉලක්ක ප්‍රසිද්ධ නොකළද, මුදල් ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා ඉවහල් වන අතරමැදි දර්ශක විචල්‍යයක් ලෙස පුළුල් මුදල් සමස්තය තව දුරටත් භාවිතා කරයි.

(ලකුණු 01)

- ශ්‍රී ලංකා මහා බැංකුව දැනට භාවිතා කරන වැඩි දියුණු කරන ලද මුදල් ප්‍රතිපත්ති රාමුව පහත පරිදි දැක්විය හැකිය.




(ලකුණු 03)

**iv.** **එක්තරා බැංකු පද්ධතියක ශේෂ පත්‍රය පහත පරිදි ඔබ වෙත ලබාදී ඇත. ව්‍යවස්ථාපිත සංචිත අනුපාතය 20% ක් වේ.**

| **වගකීම්** | **(රු.බිලියන)** | **වත්කම්** | **(රු.බිලියන)** |
|---|---|---|---|
| තැන්පතු | 100 | සංචිත | 15 |
| | | සුරැකුම්පත් | 25 |
| | | ණය | 60 |
| මුළු | 100 | මුළු | 100 |

**පහත සඳහන් ප්‍රශ්න සඳහා පිළිතුරු සපයන්න.**

**(අ) බැංකු පද්ධතියකට අතිරේව ණය සැපයීමේ හැකියාවක් පවතීද? පැහැදලි කරන්න.**

**(ආ) සියලු ගැලපුම් සිදු කිරීමෙන් පසු බැංකු පද්ධතියේ ශේෂ පත්‍රය දක්වන්න.**

**(ලකුණු 04)**

(අ) ව්‍යස්ථාපිත සංචිතය = $\frac{20}{100} * 100 =$ රු. බිලියන 20

පවතින සංචිතය ව්‍යවස්ථාපිත සංචිතයට වඩා අඩු නිසා බැංකු පද්ධතියට අතිරේකව ණය සැපයීමේ හැකියාවක් නැත.

(ලකුණු 02)

(ආ) සියලු ගැළපුම් වලින් පසු මුළු තැන්පතු = සංචිතය $* \frac{1}{r}$

$= 15 * \frac{1}{0.2}$

= රු. බිලියන 75 (ලකුණු 02)

# "ආ" උපකොටස

07\. i. සුභසාධන භාණ්ඩයක් සම්බන්ධයෙන් වෙළෙඳපොළ ආර්ථිකයක කිනම් ආකාරයක සම්පත් බෙදා හැරීමේ අකාර්යක්ෂමතාවක් පවතීද යන්න පැහැදිලි කරන්න. (ලකුණු 04)

ii. රාජ්‍ය අයවැය ලේඛනයක වර්තන ගිණුමෙ අතිරික්තයක් පැවතීමේ හිතකර ප්‍රතිවිපාකයන් මොනවාද? (ලකුණු 04)

iii. අවපාතෝද්ධමනයක් යනු කුමක්ද? එවැනි අවස්ථාවක කුමන ආකාරයේ රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්තියක් වඩාත් යෝග්‍ය වේද? පැහැදිලි කරන්න. (ලකුණු 04)

iv. ප්‍රාග්ධන වෙළෙඳපොළ ප්‍රතිසංස්කරණය යනු මොනවාද? එවැනි ප්‍රතිසංස්කරණයක වාසි සහ අවාසි මොනවාද? (ලකුණු 04)

v. 2015 වසර තුළ ශ්‍රී ලංකා රජය මුහුණ දුන් ප්‍රධාන රාජ්‍ය මූල්‍ය අභියෝගයන් මොනවාද? (ලකුණු 04)


**i. සුභසාධන භාණ්ඩයක් සම්බන්ධයෙන් වෙළෙඳපොළ ආර්ථිකයක කිනම් ආකාරයක සම්පත් බෙදා හැරීමේ අකාර්යක්‍ෂමතාවක් පවතීද යන්න පැහැදිලි කරන්න. (ලකුණු 04)**

- සුභසාධන භාණ්ඩයක් යනු පරිභෝජනයේදී ධන බාහිරතා ඇති කරන භාණ්ඩයකි.

උදා. :- අධ්‍යාපනය, සෞඛ්‍යය

-සුභසාධන භාණ්ඩයක් සම්බන්ධයෙන් පවතින සම්පත් බෙදා හැරීමේ අකාර්යක්ෂමතාවය යනු, සමාජයේ ප්‍රශස්ත ප්‍රමාණයට වඩා අඩුවෙන් නිෂ්පාදනය වීමයි. (ලකුණු 02)

- සුභසාධන භාණ්ඩයක් සම්බන්ධයෙන් ආන්තික සමාජ ප්‍රතිලාභය, ආන්තික පෞද්ගලික ප්‍රතිලාභයට වඩා වැඩි අගයකි. එම නිසා වෙළෙඳපොළ ආර්ථිකයක නිපදවන ප්‍රමාණය ($Q_E$) සාමාජීය ප්‍රශස්ත ප්‍රමාණයට ($Q_0$) ට වඩා අඩු ප්‍රමාණයකි. (ලකුණු 02)


P
සැපයුම
P0
PE
ආන්තික සමාජ ප්‍රතිලාභය
ආන්තික පෞද්ගලික ප්‍රතිලාභය
0
QE
Q0
Q

**ii. රාජ්‍ය අයවැය ලේඛනයක වර්තන ගිණුමේ අතිරික්තයක් පැවතීමේ හිතකර ප්‍රතිවිපාකයන් මොනවාද? (ලකුණු 04)**

- රාජ්‍ය ණය බර අඩු කර ගත හැකි වීම
- උද්ධමනාත්මක ප්‍රතිවිපාකයන් අඩු වීම
- තෙරපුම් ප්‍රතිවිපාකයක් ඇති නොවීම (රාජ්‍ය ණය නිසා ඇති විය හැකි පෞද්ගලික ආයෝජන - අධෛර්යමත්වීම් නොපැවතීම/ පෞද්ගලික ආයෝජන ඉහළ යාම)
- පොලී අනුපාතිකය පහළ මට්ටමක පවත්වා ගත හැකි වීම
- ජනතාව වෙත පැවරෙන බදු බර අඩු කර ගත හැකි වීම
- සාර්ව ආර්ථික ස්තායීකරණයට මග පෑදීම (කරුණු 04 කට ලකුණු 04 ක්)

**iii. අවපාතෝද්ධමනයක් යනු කුමක්ද? එවැනි අවස්ථාවක කුමන ආකාරයේ රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්තියක් වඩාත් යෝග්‍ය වේද? පැහැදිලි කරන්න.(ලකුණු 04)**

- අවපාතෝද්ධමනයක් යනු රටක සමස්ත නිමැවුම හා සේවා නියුක්තිය අඩුවන අතරම පොදු මිල මට්ටම ඉහළ යාමයි.

(ලකුණු 01)

- අවපාතෝද්ධමනයක් පවතින විට නිමැවුම සහ සේවා නියුක්තිය ප්‍රසාරණය කිරීමට ප්‍රසාරණාත්මක රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්තියක් ක්‍රියාත්මක කළහොත්, තව දුරටත් උද්ධමනය වේගවත් වේ. එම නිසා ප්‍රසාරණාත්මක රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්තියක් සමඟ සැපයුම් ප්‍රවර්ධන ප්‍රතිපත්තියක් ක්‍රියාත්මක කළ යුතුය. එමඟින් ප්‍රසාරණාත්මක රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්තියේ ප්‍රසාරණාත්මක බලපෑම අඩු කරගත හැකිය.

(ලකුණු 02)

- සැපයුම් ප්‍රවර්ධන ප්‍රතිපත්ති ලෙස බදු අඩු කිරීම, නියාමන හරණය, තාක්ෂණික සහය, පුහුණු වැඩසටහන්, ශ්‍රම වෙළෙඳපොළ ප්‍රතිසංස්කරණ ආදිය දැක්විය හැකිය. (ලකුණු 01)

**iv. ප්‍රාග්ධන වෙළෙඳපොළ ප්‍රතිසංස්කරණය යනු මොනවාද? එවැනි ප්‍රතිසංස්කරණයක වාසි සහ අවාසි මොනවාද? (ලකුණු 04)**

- නිෂ්පාදනය ඉහළ නැංවීම සඳහා බාධාවක්ව පවතින ප්‍රාග්ධන හිඟය විසඳාගත හැකි ආකාරයට කටයුතු කිරීම ප්‍රාග්ධන වෙළෙඳපොළ ප්‍රතිසංස්කරණ යනුවෙන් හඳුන්වයි. මේ සඳහා ප්‍රාග්ධනයේ ඵලදායීතාවය ඉහළ දැමීම, ඍජු විදේශ ආයෝජන දිරිමත් කිරීම, ඉතුරුම් වැඩි කිරීම වැනි දෑ කළ හැකිය. (ලකුණු 02)

වාසිය

- ආයෝජන වැඩි වී නිෂ්පාදනය සහ සේවා නියුක්තිය ඉහළ යාම (ලකුණු 01)

අවාසිය

- ලාභ සහ ලාභාංශ විදේශ රටවලට ඇදී යාම
- වර්තන වියදම් අඩු කිරීම නිසා සුභසාධනයට අහිතකර ලෙස බලපෑම (ලකුණු 01)

**v. 2015 වසර තුළ ශ්‍රී ලංකා රජය මුහුණ දුන් ප්‍රධාන රාජ්‍ය මූල්‍ය අභියෝගයන් මොනවාද?** **(ලකුණු 04)**

- ජාතික වශයෙන් වැදගත්වන මැතිවරණ දෙකක් නිසා විශාල වියදමක් දැරීමට සිදු වීම
- දේශපාලන වශයෙන් ඇති වූ අවිනිශ්චිතභාවය නිසා ජාත්‍යන්තර ප්‍රාග්ධන ගලා ඒම් සීමා වීම
- දේශීය සහ ජාත්‍යන්තර මූල්‍ය වෙළෙඳපොළවල් දැඩි වීම
- විශාල ප්‍රමාණයක ණය පරිණතවීම් ඇති වීම
-රුපියලේ බාහිර අගය විශාල වශයෙන් ක්ෂය වීම නිසා රාජ්‍ය ණය පියවීමේ රුපියල් පිරිවැය ඉහළ යාම

(කරුණු 04 කට ලකුණු 04 ක්)

# "ආ" උපකොටස

08. i. රටක් අන්තර්ජාතික වෙළෙඳාමට යොමු කරන "ස්ථිතික වාසිය" සහ "ගතික වාසිය" යනු කුමක්ද? පැහැදලි කරන්න. (ලකුණු 04)

ii. නිදහස් වෙළෙඳාම පුළුල් කිරීමෙහිලා ලෝක වෙළෙඳ සංවිධානයේ කාර්ය භාර්යය කුමක්ද? (ලකුණු 04)

iii. ශ්‍රී ලංකාව මෑත කාලීනව මුහුණ දී ඇති විශාල වෙළෙඳ හිඟයට ප්‍රධාන හේතු මොනවාද? (ලකුණු 04)

iv. ශ්‍රී ලංකාවේ සංචාරක කර්මාන්තය මුහුණ දී ඇති ප්‍රධාන අභියෝග මොනවාද? (ලකුණු 04)

v. ශ්‍රී ලංකාවේ 2015 වසර අවසානය වන විට ගෙවුම් තුලනය හා සම්බන්ධ පහත දත්ත ඔබ වෙත සපයා ඇත.

| අයිතමය | වටිනාකම (ඇ.ඩො.මි) |
|---|---|
| රජයේ විදේශ වත්කම් | 470 |
| මහ බැංකුවේ විදේශ වත්කම් | 6,834 |
| තැන්පතු භාරගන්නා ආයතන වල විදේශ වත්කම් | 2,033 |
| සංචිත වලට අදාල වගකීම් | 2,275 |

2014 වසර අවසානයේදී ශ්‍රී ලංකාවේ ශුද්ධ ජාත්‍යන්තර සංචිතය ඇ.ඩො.මි. 6,517 ක් වේ. 2015 වර්ෂය සඳහා ගෙවුම් ශේෂයේ සමස්ත ශේෂය ගණනය කරන්න. (ලකුණු 04)

i. රටක් අන්තර්ජාතික වෙළෙඳාමට යොමු කරන "ස්ථිතික වාසිය" සහ "ගතික වාසිය" යනු කුමක්ද? පැහැදිලි කරන්නි (ලකුණු 04)

- ස්ථිතික වාසිය- නිශ්පාදනය හා පරිභෝජනය මූල් කොට ගෙන රටකට ස්වභාවිකව උරුම වී ඇති වාසිය ස්ථිතික වාසිය ලෙස හඳුන්වයි. (ලකුණු 01)

- ස්ථිතික වාසිය හටගැනීමට පහත සඳහන් හේතූන් බලපායි.

1. රටවල් අතර සම්පත් සම්භාරයේ වෙනස්කම්
2. රටවල් අතර අභිරුචීන්ගේ වෙනස්කම්
3. නිශ්පාදනයේ පරිමාණානුකූල ඵල (ලකුණු 01)

- රටවල් විසින් නිර්මාණය කරගනු ලබන තත්වයන් නිසා අන්තර්ජාතික වෙළඳාමේදී ලබනවාසි ගතික වාසි ලෙස හඳුන්වයි. (ලකුණු 01)

- ගතික වාසි ඇතිවීම සඳහා පහත සඳහන් හේතු බලපායි.

1. තාක්ෂණික දියුණුව
2. භාණ්ඩ ප්‍රභේධනය
3. රාජ්‍ය ප්‍රතිපත්ති හා වෙළඳ ගිවිසුම් (ලකුණු 01)

## ii. නිදහස් වෙළෙඳාම පුළුල් කිරීමෙහිලා ලෝක වෙළෙඳ සංවිධානයේ කාර්ය භාර්යය කුමක්ද? (ලකුණු 04)

- නිදහස් වෙළඳාමට බාධාකාරී තීරුබදු පහත හෙළා ගෝලීය වෙළඳාම පුළුල් කිරීම.
- ජාත්‍යන්තර වෙළඳාමේ කෘෂි වෙළඳාමට බලපාන ආයෝජනය හා බුද්ධිමය දේපළ වැනි ක්ෂේත්‍ර වලට නිදහස් වෙළඳාම ප්‍රචලිත කිරීම.
- වෙළඳාමට බලපාන තීරු බදු නොවන බාධක ලෙස සලකන ප්‍රපාතනය, අපනයන පංගු කිරීම, සහ නිශ්පාදන ප්‍රමිතීන් පැනවීම වැනි දෑ ඉවත් කිරීමට කටයුතු කිරීම.
- වෙළඳාමේ අසමානතා ඉවත් කිරීම.
- සාමාජික රටවල්වල නිදහස් වෙළඳ ප්‍රතිපත්ති සකස් කිරීම සඳහා තාක්ෂණික සහය ලබා දීම.
- ජාත්‍යන්තර මූල්‍ය අරමුදල, ලෝක බැංකුව ඇතුලු අනෙකුත් ජාත්‍යන්තර ආයතන සමග සහයෝගීව සහ සුහදව කටයුතු කිරීම.
- ගිවිසුම් ක්‍රියාවට නැංවීම සහ ඒවා අධීක්ෂණය කිරීම.
- වෙළඳ ආරවුල් බේරුම් කිරීම.
- සාමාජික රටවල වෙළඳ ධාරිද්‍රතාවය ගොඩ නැංවීම. (කරුණු 04 කට ලකුණු 04)

**iii. ශ්‍රී ලංකාව මෑත කාලීනව මුහුණ දී ඇති විශාල වෙළෙඳ හිඟයට ප්‍රධාන හේතු මොනවාද? (ලකුණු 04)**

- ආනයන වියදම් වර්ධනයට සාපේක්ෂව, අපනයන ඉපයුම් වර්ධනය මන්දගාමී වීම.
- මහා පරිමාණ රාජ්‍ය ආයෝජන සඳහා ආනයනය කරනු ලබන ප්‍රාග්ධන භාණ්ඩ ඉහළ යාම
- ගෝලීය ආර්ථික පසුබෑසීම නිසා, ශ්‍රී ලංකාවේ අපනයන සඳහා ඉල්ලුම අධෛර්යමත් වීම.
- GSP+ තීරුබදු සහනය නොමැති වීම.
- ආනයන සඳහා තීරු බදු පහත හෙළීම.
- ආනයන සඳහා ණය පහසුකම් පුළුල් කිරීම.
- අපනයන විවිධාංගීකරණය දුර්වල මට්ටමක පැවතීම.

(කරුණු 04 කට ලකුණු 04)

**iv. ශ්‍රී ලංකාවේ සංචාරක කර්මාන්තය මුහුණ දී ඇති ප්‍රධාන අභියෝග මොනවාද? (ලකුණු 04)**

- සංචාරකයන්ගේ අපේක්ෂිත වර්ධනයට සමගාමීව සංචාරක සමයන්හි හෝටල් කාමර සංඛ්‍යාව ප්‍රමාණවත් වීම.
- පුහුණු සේවකයන්ගේ අවශ්‍යතාවය සහ ශ්‍රම සංක්‍රමණය
- ලෝක ප්‍රසිද්ධ හෝටල් දාම ශ්‍රී ලංකාව වෙත දක්වා ඇති අවධානය ප්‍රමාණවත් නොවීම සහ කොළඹ හෝටල් සඳහා පනවා ඇති අවම කාමර ගාස්තුව
- සංචාරක ව්‍යාපාරයේ උපායමාර්ගික අවධානය ඉහළ, මැද සහ පහළ පෙළ සංචාරකයින් වෙත යොමු කිරීම. ශ්‍රී ලංකාවට පැමිණෙන අති බහුතර සංචාරකයන් මැද සහ පහළ පෙළ වේ.
- සංචාරක කර්මාන්තයේ විශාල අවිධිමත් අංශයක් පැවතීම.
- අවාර සමයේ සංචාරකයන්ගේ පැමිණීම අඩු වීම. (කරුණු 04 කට ලකුණු 04)

**v. ශ්‍රී ලංකාවේ 2015 වසර අවසානය වන විට ගෙවුම් තුලනය හා සම්බන්ධ පහත දත්ත ඔබ වෙත සපයා ඇත.**

| අයිතමය | වටිනාකම (ඇ.ඩො.මි) |
|---|---|
| රජයේ විදේශ වත්කම් | 470 |
| මහ බැංකුවේ විදේශ වත්කම් | 6,834 |
| තැන්පතු භාරගන්නා ආයතන වල විදේශ වත්කම් | 2,033 |
| සංචිත වලට අදාල වගකීම් | 2,275 |

**2014 වසර අවසානයේදී ශ්‍රී ලංකාවේ ශුද්ධ ජාත්‍යන්තර සංචිතය ඇ.ඩො.මි. 6,517 ක් වේ. 2015 වර්ෂය සඳහා ගෙවුම් ශේෂයේ සමස්ත ශේෂය ගණනය කරන්න.**

**(ලකුණු 04)**

2015 වසර අවසානයේ දී මුළු නිල සංචිත ප්‍රමාණය = 470 + 6834

= **ඇමරිකානු ඩොලර් මිලියන 7304** **(ලකුණු 01)**

2015 වසර අවසානයේ දී ශුද්ධ ජාත්‍යන්තර සංචිතය = 7304 – 2275 = **5029**

**(ලකුණු 01)**

2015 වසර සඳහා ගෙවුම් ශේෂයේ සමස්ත ශේෂය= 5029 - 6517= -1488

**(ලකුණු 02)**

**ගෙවුම් ශේෂයේ සමස්ත ශේෂයේ හිගය අමරිකානු ඩොලර් මිලියන 1488**

# “ආ” උපකොටස

09\. i. ගෝලීයකරණයේ ගාමක බලවේගයන් මොනවාද? යන්න දක්වා ගෝලීයකරණයේ අවාසි දක්වන්න් (ලකුණු 06)

ii. ආර්ථික වර්ධනයේ පිරිවැය යනු කුමක්ද? පැහැදිලි කරන්න. (ලකුණු 04)

iii. මානව සංවර්ධන දර්ශකයට අනුව රටවල් වර්ගීකරණය කරනු ලබන්නේ කෙසේද? (ලකුණු 04)

iv. 2015 වර්ෂයේ දී ලෝක නායකයන් වසින් පිහිටුවා ගන්නා ලද “තිරසාර සංවර්ධන අභිමතාර්ථ” යනු මොනවාද? පැහැදිලි කරන්න. (ලකුණු 06)

i. ගෝලීයකරණයේ ගාමක බලවේගයන් මොනවාද? යන්න දක්වා ගෝලීයකරණයේ අවාසි දක්වන්න (ලකුණු 06)

**ගාමක බලවේග**

- ප්‍රවාහන ක්ෂේත්‍රයේ වර්ධනය
- තාක්ෂණයේ වර්ධනය
- ගෝලීය මූල්‍ය වෙළඳපළවල නියාමනකරණය
- රටවල් අතර සාපේක්ෂ වාසි වෙනස්වීම
- බහු ජාතික සමාගම් නිෂ්පාදනයේ විවිධ ක්‍රියාවලීන් විවිධ රටවල ස්ථානගත කිරීම
- ආරක්ෂණවාදී ප්‍රතිපත්ති ඉවත් කිරීම
- පිරිමණානුකූල පිරිවැසුම්
- ආර්ථික ඒකාබද්ධ වීම් (කරුණු 03 කට ලකුණු 03)

**අවාසි**

- ජාත්‍යන්තර වශයෙන් ආදායම් විශමතා පුළුල් වීම
- පාරිසරික ගැටළු
- දේශීය ආර්ථික ක්‍රමවල ස්වෛරීත්වයට තර්ජන පැන නැගීම
- සංස්කෘතික විවිධත්වයට හානි සිදුවීම
- මූල්‍ය වෙළඳපළ අස්ථායිතාවයක් හට ගැනීම
- දේශීය නිශ්පාදන ක්ෂේත්‍රවල පසුබැසීම සහ රැකි රක්ෂා අවස්ථා අහිමි වීම
- ජාත්‍යන්තර ත්‍රස්තවාදය සහ සෞඛ්‍ය ගැටලු

**(කරුණු 03 කට ලකුණු 03)**

**ii. ආර්ථික වර්ධනයේ පිරිවැය යනු කුමක්ද? පැහැදිලි කරන්න. (ලකුණු 04)**

- ආර්ථික වර්ධනයේ පිරිවැය යනු ආර්ථික වර්ධනය තුළින් රටකට ඇති වන විවිධ අවාසිදායක තත්ත්වයන් වේ. එය පහත පරිදි දැක්විය හැක.

1. උද්ධමනයක් ඇතිවීමේ අවධානම
2. පාරිසරික ගැටලු
3. ආදායම සහ ධනය ව්‍යාප්තවීමේ විශමතා ඉහළ යාම
4. ප්‍රාදේශීය විශමතා
5. තිරසාර සංවර්ධනයට හානිකරවීම
6. ඉහළ ආදායම් ලබන රටක් ලෙස වර්ගීකරණය වීමෙන්, මානව සුභසාධනය ඉහළ නැංවීම සඳහා ලැබෙන ජාත්‍යන්තර සහය අහිමි වීම

(කරුණු 04 කට ලකුණු 04)

iii. මානව සංවර්ධන දර්ශකයට අනුව රටවල් වර්ගීකරණය කරනු ලබන්නේ කෙසේද? (ලකුණු 04)

| වර්ගීකරණය | දර්ශකයේ අගය |
|---|---|
| ඉතා ඉහළ මානව සංවර්ධන සහිත රටවල් | 0.900 සහ ඊට වැඩි |
| ඉහළ මානව සංවර්ධන සහිත රටවල් | 0.800 - 0.899 |
| මධ්‍යම මානව සංවර්ධන සහිත රටවල් | 0.500 - 0.799 |
| පහළ මානව සංවර්ධන සහිත රටවල් | 0.000 - 0.499 |

(එක වර්ගීකරණයකට ලකුණු 01 බැගින් ලකුණු 04)

**iv. 2015 වර්ෂයේ දී ලෝක නායකයන් වසින් පිහිටුවා ගන්නා ලද "තිරසාර සංවර්ධන අභිමතාර්ථ" යනු මොනවාද? පැහැදිලි කරන්න. (ලකුණු 06)**

- 2000 වසරේදී හඳුන්වාදුන් සහස්‍ර සංවර්ධන අභිමතාර්ථ සඳහා අනුප්‍රාප්තික අභිමතාර්ථ ලෙස එක්සත් ජාතීන්ගේ සංවිධානයේ සාමාජික රටවල් විසින් 2015 සැප්තැම්බර් මාසයේදී තිරසාර සංවර්ධන අභිමතාර්ථ පිහිටුවා ගන්නා ලදී.

(ලකුණු 01)

- ප්‍රධාන වශයෙන්ම මෙම අභිමතාර්ථ පිහිටුවන ලද්දේ දිළිඳුකම පිටුදැකීම, පෘථිවිය ආරක්ෂා කිරීම, සෞභාග්‍යය උදාකිරීම, සාමය ආරක්ෂා කිරීම, හවුල් කටයුතු ක්‍රියාත්මක කිරීම යන පුළුල් ක්ෂේත්‍ර පහ ආවරණය වන ලෙසය. (ලකුණු 01)

- මෙහිදී තිරසාර සංවර්ධන අභිමතාර්ථ න්‍යාය පත්‍රය සකස් කිරීමේ දී, තිරසාර සංවර්ධන අභිමතාර්ථ 17 ක් සහ ඉලක්ක 169 ක් ප්‍රකාශයට පත් කරන ලදී.

(ලකුණු 01)

උදාහරණ :-

අභිමතාර්ථ 01 - සියලු ආකාරයේ දිළිඳු බව, සියලු තැන්හිම දුරු කිරීම.

අභිමතාර්ථ 02 - කුසගින්න දුරලීම, ආහාර සුරක්ෂිතතාව සහ පෝෂණ වැඩිදියුණුව ලබා ගැනීම , සහ තිරසාර කෘෂිකාර්මික ප්‍රවර්ධනය

අභිමතාර්ථ 03 - සෑම මසකම සියලු දෙනාටම සෞඛ්‍ය සම්පන්න දිවියක් තහවුරු කරන අතර යහ පැවැත්ම ප්‍රවර්ධනය කිරීම

අභිමතාර්ථ 04 - සියල්ලන් සඳහා පරිපූර්ණ සහ සාධාරණ ගුණාත්මක අධ්‍යාපනයක් සහතික කිරීම හා දිවිය පුරාම ඉගනුම් අවස්ථා ප්‍රවර්ධනය කිරීම.

අභිමතාර්ථ 05 - ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය ලගාකර ගැනීම සහ සියලුම කාන්තාවන් සහ ගැහැණු ළමුන් සවිබල ගැන්වීම.

(එකකට 01 බැගින් ලකුණු 03)

# “ආ” උපකොටස

10\. i. ආදායම් දරිද්‍රතාවය හා මානව දරිද්‍රතාවය අතර වෙනස පැහැදිලි කරන්න.

(ලකුණු 04)

ii. ශ්‍රී ලංකාවේ ආදායම් විෂමතාවය සහ ළමා පෝෂණ ඌනතා සම්බන්ධයෙන් පවතින “සමාජ ආර්ථික අභියෝගයන් මොනවාද? (ලකුණු 06)

iii. ශ්‍රී ලංකාව “ජනගහනය වියපත් වීමේ” ගැටළුවට කෙසේ මුහුණ දී තිබෙන්නේද? එමගින් ශ්‍රී ලංකාවට ඇතිවන බහුමාන අභියෝගයන් මොනවාද? (ලකුණු 06)

iv. කුඩා සහ මධ්‍ය පරිමාණ ව්‍යාපාර වල වර්ධනය සීමා වීම සඳහා ශ්‍රී ලංකාවේ ප්‍රාදේශීය වාතාවරණය බලපාන්නේ කෙසේද? (ලකුණු 04)

## i. ආදායම් දරිද්‍රතාවය හා මානව දරිද්‍රතාවය අතර වෙනස පැහැදිලි කරන්න.

**(ලකුණු 04)**

- ආදායම් දරිද්‍රතාවය යනු මූලික මිනිස ජීවන අවශ්‍යතාවයන් සපුරා ගැනීම සඳහා ආදායම් ප්‍රමාණවත් නොවීමයි.

- ආදායම් දරිද්‍රතාවයේදී ආදායම ප්‍රමාණවත් නොවීම නැමැති නිර්ණායකය කෙරෙහි අවධානය යොමු කරනු ලැබේ. (ලකුණු 02)

- මානව දරිද්‍රතාවය යනු නිදහස, ආත්ම ගරුත්වය හා අන්‍යයන්ගේ සැලකිල්ල භුක්ති විඳිමින්, සෞඛ්‍ය සම්පන්නව හා සතුටුදායක ජීවන තත්වයක් ගත කිරීමට සමත්, මානව සංවර්ධනයක් සඳහා ඉඩ ප්‍රස්ථා හා තේරීම් අහිමි වී යාමයි.

- මානව දරිද්‍රතාවය බහුමාන සංකල්පයක් වන අතර ආදායම් දරිද්‍රතාවයට අමතරව හුදකලා වීම, බල රහිත වීම, පීඩනයන්ට ගොදුරුවීම, කායික දුබලතා වැනි දෑද මානව දරිද්‍රතාවය මගින් නිරූපණය වේ. (ලකුණු 02)

## ii. ශ්‍රී ලංකාවේ ආදායම් විෂමතාවය සහ ළමා පෝෂණ ඌනතා සම්බන්ධයෙන් පවතින "සමාජ ආර්ථික අභියෝගයන් මොනවාද? (ලකුණු 06)

ආදායම් විෂමතාවය

- ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ **2012/2013** ගෘහ ඒකක ආදායම් සහ වියදම් සමීක්ෂණයට අනුව මධ්‍යයන්‍ය මධ්‍යස්තය මාසික ගෘහ ඒකක ආදායම් පිලිවෙලින් රුපියල් **45878** ක් සහ රුපියල් **30814** ක් වේ. මෙමගින් ආදායම් ව්‍යාප්තියේ සැලකිය යුතු විෂමතාවයක් පවතින බව නිගමනය කල හැක.

- ගෘහ ඒකකයක වැඩිම මාසික මධ්‍යයන්‍ය ආදායම (රුපියල් **77723**ක්) කොළඹ දිස්ත්‍රික්තයෙන්ද ගෘහ ඒකකයක අඩුම මධ්‍යයන්‍ය මාසික ආදායම (රුපියල් **23687** ක් ) මුලතිව් දිස්ත්‍රික්කයෙන් වාර්තා වේ.

- ඉහළම ආදායම් ලබන 10% ක කුටුම්භ මුළු ආදායමෙන් 38% ක් ද ඉහළම ආදායම් ලබන 20% ක කුටුම්භ මුළු ආදායමෙන් 53% ක් ද හිමි කර ගනී.

- දැඩි ආදායම් ව්‍යාප්ත විෂමතාවය හේතුවෙන් දරිද්‍රතාවය සමාජ අසහනය පන්ති භේදය වැනි ගැටළු ඇති වේ. එම නිසා ආදායම් සමානතාවය වැඩි දියුණු කිරීමට සුදුසු උපායන් ක්‍රියාත්මක කිරීමේ දැඩි අවශ්‍යතාවයක් පවතී.

**(කරුණු 03 කට ලකුණු 03)**

<u>ළමා පෝෂණ ඌනතාවය</u>

- ශ්‍රී ලංකාවේ ළමයින්ගේ වැඩීම වළක්වන අනුපාතය ඇෆ්ගනිස්තානය සහ පකිස්ථානය වැනි රටවලට වඩා අඩු වුවද චීනය, තායිලන්තය සහ මැලේසියාව වැනි වෙනත් මැදි ආදායම් ලබන ආසියානු රටවලට වඩා ඉහළ අගයක් වේ.

- ශ්‍රී ලංකාවේ දිස්ත්‍රික්ක 25 න් 24 කම (කොළඹ හැර) උසට සරිලන බරක් නොමැති වීම අවුරුදු 05 ට අඩු ළමුන්ගෙන් 5% කට වඩා වැඩි වේ.

- ශ්‍රී ලංකාවේ අවුරුදු 05 ට අඩු ළමුන්ගෙන් 2.3% (40000 ) ක් දරුණු මන්දපෝෂණයෙන් පෙළෙන අතර මිලියන 4 කට වඩා වැඩි (විශේෂයෙන්ම කාන්තාවන් සහ ළමයි) නීරක්තියෙන් පෙළෙයි.

- ශාරීරික සහ මානසික සංවර්ධනයට ළමුන්ගේ ඇති හැකියාව අඩු වීම, පාසැල් පැමිණීම සහ කාර්ය සාධනය දුර්වල වීම, මෙවැනි ළමුන් ශ්‍රම බලකායට ඇතුළත් වීමේදි නිෂ්පාදන ධාරිතාවය අඩු වීම වැනි අහිතකර ප්‍රතිවිපාකයන් ළමා පෝෂණ ඌනතාවයෙන් ඇතිවේ. (කරුණු 03 කට ලකුණු 03)

## iii. ශ්‍රී ලංකාව "ජනගහනය වියපත් වීමේ" ගැටළුවට කෙසේ මුහුණ දී තිබෙන්නේද? එමගින් ශ්‍රී ලංකාවට ඇතිවන බහුමාන අභියෝගයන් මොනවාද?

**(ලකුණු 06)**

<u>වියපත් වන ජනගහනයේ ස්වභාවය</u>

- ශ්‍රී ලංකාව, එක්සත් ජාතීන්ගේ සංවිධානයට අනුව දකුණු ආසියාවේ වේගයෙන්ම වියපත් වන ජනගහනය වන අතර ලොව වේගයෙන්ම වියපත් වන ජනගහන අතරින් එකක් වේ.

- **2015** වසරේදි ශ්‍රී ලංකාවේ ජනගහනය මිලියන **20.96** ක් වූ අතර, එයින් 13.9% ක් වයස අවුරුදු **60** ට වැඩි බවට ඇස්තමේන්තු කර ඇත. මෙම අගය වසර **2050** සහ **2100** වන විට පිලිවෙලින් **28.6%** සහ 40% වන බවට එක්සත් ජාතීන්ගේ සංවිධානය **2015** දි ඇස්තමේන්තු කර ඇත.

**(ලකුණු 02)**

බහුමාන අභියෝග

- ශ්‍රී ලංකාවේ වැඩිහිටි ජනගහනයේ 10% කට පමණක් ස්ථිර විශ්‍රාම වැටුප් පවතින නිසා වැඩිහිටියන්ගේ සුභසාධන මට්ටම පහළ යාම

- සීඝ්‍ර නාගරීකරණයත් සමගම කුඩා පවුල් ඇතිවන නිසාත්, ස්ත්‍රීන් වැඩි වැඩියෙන් ශ්‍රම බලකායට ඇතුළු වන නිසා වැඩිහිටියන්ට පවුල් වලින් ලැබෙන උපකාර අඩුවේ.

- විශ්‍රාම වැටුප් සහ සෞඛ්‍ය වියදම් ඉහළ යාම හේතුවෙන් අයවැය මත පීඩනයක් ඇති වීම.

- වැඩිහිටියන්ගේ ඉතුරුම්, ප්‍රාග්ධන සම්පාදනයන්ට වඩා විශාල වශයෙන් පරිභෝජනයට වෙන් වූ නිසා ප්‍රාග්ධන සම්පාදනය මත සෘණාත්මක බලපෑම් ඇති වීම.

- වැඩ කරන වයසේ ජනගහන ප්‍රතිශතය අඩු වීම තුළින් ශ්‍රම බලකාය හීන වී ආර්ථික වර්ධනය අඩාල වීම.

- ආදායම් බදු පදනම මෙන්ම ගෘහ ඒකක ආදායම් මට්ටම් අඩු වීම තුළින් රජයේ බදු ආදායම් පහල යාම.

(ලකුණු 04)

**iv. කුඩා සහ මධ්‍ය පරිමාණ ව්‍යාපාර වල වර්ධනය සීමා වීම සඳහා ශ්‍රී ලංකාවේ ප්‍රාදේශීය වාතාවරණය බලපාන්නේ කෙසේද? (ලකුණු 04)**

- විධිමත් මූල්‍ය ආයතන වෙත ලගාවීමට ග්‍රාමීය ව්‍යවසායකයන්ට ඇති අවස්ථා ඉතා සීමිත වීම
- අධික බලශක්ති පිරිවැය
- ප්‍රාදේශීය වෙළඳපොළවල් වලට ඇතුළු වීමේදී ඇති සිමාවන්
- වෙළඳපොළ තොරතුරු අපූර්ණත්වය
- රාජ්‍ය අංශයේ සේවාවන් සැපයීමේදී පවතින අකාර්යක්ෂමතා
- යටිතල පහසුකම් ප්‍රමාණවත් නොවීම.
- යෙදවුම් මිලදී ගැනීමේ අපහසුතා

(ලකුණු 04)

සකස් කරන ලද්දේ,

**ආනන්ද රත්නායක**

- ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, ව්‍යාපාර ආර්ථික විද්‍යා අධ්‍යයනාංශය, කළමනාකරණ අධ්‍යයන හා වාණිජ විද්‍යා පීඨය

සහාය:

- තිළිනි නවරත්න (ව්‍යාපාර ආර්ථික විද්‍යා අධ්‍යයනාංශය, කළමනාකරණ අධ්‍යයන හා වාණිජ විද්‍යා පීඨය)
- දිලාන් රාජපක්ෂ (ව්‍යාපාර ආර්ථික විද්‍යා අධ්‍යයනාංශය, කළමනාකරණ අධ්‍යයන හා වාණිජ විද්‍යා පීඨය)

# නිමාව

A/L Economics – Ananda Rathnayake
2016 July, Japura Media, University of Sri Jayewardenepura